# 11. අපේ ආදර අම්මා

මරියතුමිය ජේසුතුමාට හොඳින් ඉගැන්වූවා. එතුමාව ආදරයෙන් රැක බලා ගත්තා. මරියතුමිය නිතර ම දෙවි පියාට කතා කළා. දෙවි පියාට කතා කරන අන්දම ජේසුතුමාටත් කියා දුන්නා.

ජුසේතුමා සහ ජේසුතුමා සමඟ ඇය සෑම දා ම දෙවි පියාට කතා කළා.

අපිත් මරියතුමිය වගේ සෑම දා පවුලේ අය සමඟ දෙවි පියාට කතා කරමු.



ජේසුතුමා මරියතුමියට ආදරෙයි.
අපිත් එතුමියට ආදරේ කරමු.

එතුමිය වගේ අපිත්
අනිත් අයට ආදරේ කරමු. උදවු කරමු.



## පැවරුම්

1. අම්මාට සහ තාත්තාට උදවු කිරීමට ඔබට ද පුළුවන. ඒ සඳහා ඔබට කළ හැකි දේවල් දෙකක් ලියන්න.
3. සැම දා ම සවස දෙමාපියන් සහ පවුලේ අනිත් අය සමඟ දෙවි පියාට කතා කරන්න පුරුදු වන්න.